<u>කලවාන ප්‍රාදේශීය සභාව</u>

<u>රත්නපුර දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 08 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 27 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කලවාන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේදී දේශීය ණය හා සංවර්ධන අරමුදල මඟින් ලබාගත් ගිණුම්ගත නොකල ණය මුදල සමාලෝචිත වර්ෂය තුලදී ගිණුම්ගත කිරීමේදී ජ'නල් සටහන් මඟින් රු. 4,629,410 ක් ගැලපීම් කර තිබුණද, තවදුරටත් ලෙජර් ගිණුමේ ශේෂය සමඟ බාහිර වගකීම සැසඳීමේදී රු. 951,395 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය වෙනුවෙන් ගෙවිය යුතු ණය පොලිය රු. 127,183 ක් සමාලෝචිත වර්ෂයේ වියදමට ගැලපීම් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ජූනි, ජූලි, අගෝස්තු මාසයන්හි කැලි කසල බැහැර කිරීම වෙනුවෙන් මුදල් ගෙවීමේදී හිලව් කරනු ලැබූ සතිපොල හා ඌරු මස් කඩ වෙනුවෙන් වූ කුලී මුදල් රු. 300,025 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ආදායම් සහ වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල බලවින්න කොන්ක්‍රීට් අංගනයෙන් හියුම් පයිප්ප මිලදී ගැනීමේ අපේක්ෂාවෙන් නිකුත් කරන ලද රු. 1,102,305 ක් වටිනාකමින් යුත් චෙක්පතක් අවලංගු කිරීමේදී අදාල වියදම් ගිණුම බැර කරනු වෙනුවට, සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර තිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ වියදම එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල වියදම් වෙනුවෙන් නිකුත් කරන ලද වටිනාකම රු. 134,012 ක්වූ චෙක්පත් 02 ක් ගෙවීමට ඉදිරිපත් නොකිරීම මත ආදායමට ගැනීමේදී සමාලෝචිත වර්ෂයේ වියදමට ගැලපීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්ථන අයභාරය රු. 6,239,691 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්ථන අයභාරය රු. 8,447,529 ක් විය.

(ආ) සභාව විසින් ඉකුත් වර්ෂ වල ගිණුම්ගත කර නොතිබූ ආදායම් හා වියදම් ගිණුම් විෂයයන් හා ගිණුම් වලට කරන ලද ගැලපීම් සමුච්චිත අරමුදලට ගැලපීම වාර්ෂිකව සිදුකර තිබීම නියත ලක්ෂණයක් බවට පතවී තිබුණි. මේ නිසා යම් වර්ෂයක මූල්‍ය ප්‍රතිඵලය කෙරෙහි විශ්වාසය තැබිය නොහැකි විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සම්බන්ධයෙන්ද මෙවැනි ගැලපීම් ඉදිරි වර්ෂ වලදී සිදුවීමේ අවදානම තිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | මූල්‍ය ප්‍රතිඵලය | සමුච්චිත අරමුදලට ගැලපීම | | ගැලපීමෙන් පසු මූල්‍ය ප්‍රතිඵලය |
|---|---|---|---|---|
| | රු. | හර | බැර | රු. |
| | | රු. | රු. | |
| 2013 | (4,131,822) | 4,843,815 | 5,129,594 | (3,846,043) |
| 2012 | 1,425,266 | 3,891,000 | 1,586,186 | (879,548) |
| 2011 | 3,780,723 | - | 5,488,660 | 9,269,380 |

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 2,207,838 කින් අඩුවී තිබූ අතර, එය සියයට 26 ක අඩුවීමක් බව නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් වල වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| (i) වරිපනම් හා බදු | 2,433 | 1,789 | 643 |
| (ii) බදු කුලී | 6,615 | 5,414 | (1,201) |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,165 | 507 | (657) |
| (iv) වෙනත් ආදායම් | 7,443 | 8,293 | 849 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් බදු, බදුකුලී , බලපත්‍ර ගාස්තු, සේවා සඳහා ගාස්තු සහ වරෙන්තු හා දඩ යන ආදායම් විෂයයන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 92, සියයට 23, සියයට 45, සියයට 59 හා සියයට 20 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු

වරිපනම් ඒකක 1166 කින් වර්ෂ ගණනාවක සිට පැවත එන රු. 2,527,842 ක හිඟ වරිපනම් බදු ශේෂයක් අයවීමට තිබුණි.

2.3.4 බදු කුලී

පළාත් පාලන කොමසාරිස්ගේ 2009 මාර්තු 09 දිනැති අංක ප.පා.කො/2009 චක්‍රලේඛ විධිවිධාන අනුව යටත් පිරිසෙයින් වර්ෂ 05 කට වරක්වත් තක්සේරුගත බදු කුළිය සංශෝධනය කල යුතු වුවත්, සභාවට අයත් කඩකාමර සඳහා වන කුළිය යාවත්කාලීන කර නොතිබුණි.

2.3.5 සම්පූර්ණ කුළුණු ගාස්තු

-------------------------------

2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනය පරිදි සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත දුරකථන හා සන්නිවේදන කුළුණු සඳහා අනුමැතිය ලබා දීමේදී ගැසට් පත්‍රය ප්‍රකාරව විධිමත් ක්‍රමවේදයක් අනුව ගාස්තු අයකිරීමක් කල යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.3.6 බලපත්‍ර ගාස්තු

----------------

කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකල යුතු සභා බල ප්‍රදේශය තුල පවත්වා ගෙනයන ආයතන පිළිබඳ සමීක්ෂණයක් 2015 මැයි මස වනවිටද සිදුකර නොතිබූ අතර, ආදායම් ලේඛණ වලින් සභාවට එකතුවන ආදායම පමණක් දැක්වෙන අතර, සභාව වෙත ලැබිය යුතු ආදායම පිළිබඳ නිශ්චිත තොරතුරු සභාව සතුව නොතිබුණි.

2.3.7 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නව වෙළඳ සංකීර්ණයේ කඩකාමර 03 කට අදාලව 2015 මැයි මස වනවිටත් රු. 13,450 ක හිඟ මුදලක් අයවීමට තිබූ අතර, පොදු වෙළඳපොලේහි පැරණි කඩකාමර 05 කට අදාලව රු. 14,350 ක හිඟ මුදලක් අයවීමට තිබුණි.

(ආ) සභාව සතු භූමිය තුල වෙළඳාම් කිරීම වෙනුවෙන් රු. 246,361 ක හිඟ මුදලක් අයකර ගැනීමට තිබූ අතර, ඔවුන් සමඟ විධිමත් පරිදි ගිවිසුමකට හෝ එළඹ නොතිබීම තුල හිඟ මුදල අයකර ගැනීම උදෙසා නෛතික ක්‍රියාමාර්ග වැනි ඉදිරි ක්‍රියාමාර්ග කිසිවක් සභාව විසින් ගෙන නොතිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර හා තාවකාලික දැන්වීම් පුවරු සම්බන්ධයෙන් සවිස්තරාත්මක ලේඛණයක් නඩත්තු කර ගැසට් නිවේදනය මඟින් ප්‍රසිද්ධ කර

අදාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතු වුවද, සභාව විසින් එලෙස කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩම් හා දේපල සම්බන්ධ යාවත්කාලීන හා ප්‍රමාණවත් තොරතුරු අඩංගු ස්ථාවර වත්කම් ලේඛණයක් සභාව සතුව නොතිබුණි.

(ආ) සභාවේ සේවයේ නියුතුව සිටි නිළධාරීන් 03 දෙනෙකු වෙත ලබා දී තිබූ රු. 27,699 ක ණය මුදලක් 2015 මැයි මස වනවිටත් ආපසු අයකර නොතිබුණි.

(ඇ) මධ්‍යම පරිසර අධිකාරිය මඟින් 2009 ඔක්තෝබර් 30 දින රු. 903,181 ක මුදලක් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා ලබා දී තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේදී පැවති අසාමාන්‍ය ප්‍රමාදය හේතුවෙන් එම ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා වු ගිවිසුම අවසන් කර ඇති බවත්, රු. 903,181 ක මුදල නැවත ලබාදෙන ලෙසත්, මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා විසින් දන්වා තිබුණි. විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 මැයි මස වනවිටත් උක්ත මුදල් නැවත ඔවුන් වෙත යැවීමට කටයුතු කර නොතිබූ අතර, කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහාද ප්‍රශස්ථ වැඩපිළිවෙලක් හෝ යොදා නොතිබුණි. මෙම තත්ත්වය යටතේ මධ්‍යම පරිසර අධිකාරිය මඟින් කලවාන ප්‍රාදේශීය සභාවට එරෙහිව නීතීමය පියවර ගැනීමේ අවදානමක් නිරීක්ෂණය විය.

3.2 අවිධිමත් ගනුදෙනු

-----------------------

කසල කළමනාකරණය පිළිබඳව 2014 නොවැම්බර් 10 සිට 2014 නොවැම්බර් 16 දින දක්වා තායිලන්තයේදී පැවති පුහුණු වැඩමුළුව සඳහා සභාපතිවරයා වෙනුවෙන් රු. 98,220 ක මුදලක් පෞද්ගලික ආයතනයකට සභා අරමුදලින් ගෙවා තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) නිශ්චිත කැඳවීම් ලිපියක් ලැබීමෙන් තොරව පෞද්ගලික ආයතනයක් මඟින් ලද විද්‍යුත් තැපැල් ලිපියක් මත ගරු ආණ්ඩකාරවරයාගේ පූර්ව අනුමැතියක් ලබා නොගෙන මුදල් ගෙවා තිබුණි.

(ii) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2010 ඔක්තෝබර් 11 දිනැති අංක 01/2010/01 දරන චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව විධිමත් පරිදි නිවාඩු අනුමත වීමට ප්‍රථම සහභාගී වූ විදේශ සංචාරය වෙනුවෙන් රු. 39,750 ක් අනියම් දීමනා වශයෙන් සභා අරමුදලින් වැය දරා තිබුණි.

(iii) පළාත් පාලන ප්‍රධානියෙකු, නියෝජිතයෙකු හෝ සභිකයෙකු විදේශ පුහුණු වැඩසටහන් සඳහා තෝරා ගන්නේ නම් අදාල සංවිධානය හෝ විදේශීය රජය හෝ විදේශීය ආයතනය හෝ ඒ සඳහා වැය වන සියළු වියදම් හා පහසුකම් දැරිය යුතු වුවත්, ඒ පිළිබඳව නොසලකා කටයුතු කර තිබුණි.

(iv) පුහුණුව අවසන් වී මාස 06 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, විදේශීය පුහුණුව මඟින් ලබාගත් දැනුම දේශීය වශයෙන් උපයෝගී කරගන්නා ආකාරය පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

(v) ජනාධිපති ලේකම්ගේ 2012 ජූනි මස 11 දින අංක CSA1/1/16 දරන ලිපියේ සඳහන් පරිදි පෞද්ගලිකව කරනු ලබන ආරාධනා මත විදේශයන්හි ශිෂ්‍යත්ව හා වෙනත් වැඩ සටහන් සඳහා ඉල්ලීම් නොකල යුතු බවට දන්වා තිබියදී උක්ත විදේශ සංචාරය සිදුකර තිබුණි.

3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

පරීක්ෂණ කණ්ඩායමක් මඟින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර කුකුලේගම ප්‍රදේශයේ කොට්ටණුහේන නැමති ඉඩමේ ස්ථිර කසල ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය ඉදිකිරීමට තීරණය කර තිබූ අතර, එදින සිට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන තුරු තාවකාලිකව සෞඛ්‍ය ආරක්ෂිතව කසල බැහැර කිරීම සඳහා තීරණය කර තිබුණි. නමුත් විගණිත අවස්ථාව වූ 2015 මැයි මස දක්වා උක්ත ව්‍යාපෘතියේ ප්‍රගතියක් නොතිබුණි.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා යෝජිත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කොස්වත්ත කොරලේගොඩ වත්ත නැමති ඉඩමෙන් අක්කර 09 ක බිම් කොටසක වට මැනීම සඳහා ගාස්තු වශයෙන් 2014 ජුලි 17 දින රු. 70,000 ක මුදලක් ගෙවා තිබුණි. එතෙකුදු වුවද කොට්ටණුහේන ඉඩමෙහි අදාල කසල ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිය

ඉදිකිරීමට යෝජනා වීම මත දරා ඇති රු. 70,000 ක මුදල නිශ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි.

4. පද්ධති හා පාලනය

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) සන අපද්‍රව්‍ය කළමනාකරණය